මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව
අනුරාධපුර දිස්ත්‍රික්කය
-----------------------------------------------

01. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 21 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 09 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 04 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ රු.425,200 ක බිල්කල කසළ බදු ආදායම රු.340,300 ක් ලෙස ගිණුම්ගත කර තිබුණු බැවින් රු.84,900 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වර්ෂයට අදාළ බිල්කල ආදායම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | ගිවිසුම්ගත වීම සිදුකර ඇත්තේ 2019 ජුනි මස සිට බැවින් ලේඛනය පරිදි වර්ෂය සඳහාම අයවිය යුතු වටිනාකම නොදක්වා ගිවිසුම්ගත වූ දින සිට වටිනාකම දක්වා ඇත. |
| (ii) | මාර්ග පරිහරණය වෙනුවෙන් ලැබී තිබුණු රු.60,000 ක මුදල පොදු තැන්පත් ලෙස දක්වා තිබුණි. | වර්ෂයට අදාළ සියළුම ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කළයුතු වේ. | බොරළු ප්‍රවාහනය වෙනුවෙන් ලද රු.60,000 ක මුදල වැරදීමකින් පොදු තැන්පත් ගිණුමට බැර කර ඇති බැවින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iii) | ලිපිද්‍රව්‍ය පරිභෝජන වියදම් රු.513,908 ක් සමුච්චිත අරමුදලට ගැලපුම්කර තිබුණි. | වර්ෂයට අදාළ වියදම් වර්ෂයේ ආදායමට ගැලපුම්කර දැක්විය යුතුවේ. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කරමි. |
| (iv) | ඉකුත් වර්ෂ 03 කට පෙර උපයා තිබුණු රු.255,035 ක ආදායම් තැන්පත් ගිණුමේ දක්වා තිබුණි. | පෙර වර්ෂවල ආදායම් හඳුනාගෙන නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවේ. | පිළිගනිමි. |
| (v) | මස්කඩ බදු හිඟ ආදායම් 38,400 ක් රු.50,000 ක තැන්පතුවෙන් හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | හිඟ මුදල තැන්පතුවෙන් හිලව් කර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| (vi) | පුරනැඟුම ව්‍යාපෘතියට පියවීම් කළ යුතුව තිබුණු රු.2,874,620 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | සියළු බැරකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. | පුරනැගුම ව්‍යාපෘතියට පියවීම් කල යුතුව ඇති 2,874,628 ක බැරකම් නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. |
| (vii) | 2018 වර්ෂය වෙනුවෙන් ලැබිය යුතුව තිබුණු රු.7,362,000 මුද්දර බදු ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | සියළුම හිඟ ආදායම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |

(ආ) නොසැසඳුනු ගිණුම්
---------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව හිඟ මුද්දර බදු වටිනාකම රු.24,351,268 ක් වුවද එදිනට ලේඛනය අනුව දැක්වෙන වටිනාකම රු.15,451,268 ක් වූයෙන් රු.8,900,000 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ණය වටිනාකම රු.2,737,082 ක් වුවද එදිනට අරමුදලේ ශේෂ සනාථ කිරීමේ ලිපිය අනුව රු.2,237,082 ක් වූයෙන් රු.500,000 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | දේශීය ණය සංවර්ධන අරමුදල ගිණුම තුලනය කිරීමේදී සිදු වූ වරදක් මත එහි ශේෂය රු.500,000 ක් අඩුවෙන් පෙන්වන අතර ශේෂ සනාථ කිරීමේ ලිපියෙහි පවතින රු.2,237,082 නිවැරදි වටිනාකම වේ. |

(ඇ) ලැබිය යුතු ගිණුම්

--------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.1,695,097 ක් වූ ගිණුම් ශේෂ 08 ක් වසර 06 ක් ඉක්මවූ කාලයක සිට පැවත එමින් තිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේ අවසාන ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

---------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.67,769,536 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාලව සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | මූලාශ්‍ර ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | පිළිගනිමි |

1.4 අනුකූල නොවීම්

-------------------

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

------------------------------------------------------------------------------

| නීති,රීති,රෙගුලාසි හා කළමණාකරන තීරණ වලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (i) | 2003 අංක 17 දරන රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල් පනත | රු. 480,787 | 2019 පෙබරවාරි මස සිට අරමුදලට දායක මුදල් ප්‍රේෂණය කර නොතිබුණි. | 2003 අංක 17 දරන රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල් පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |
| (ii) | 2003 අධිකාරය, මෝටර් වාහන පනත 2:1 වගන්තිය | - | ට්‍රැක්ටර් 02 ක් ටේලර් 02 ක් සහ බවුසර 02 ක් ලියාපදිංචි නොකර ධාවනයට යොදවා තිබුණි. | පනත අනුව කටයුතු කළ යුතු වේ. | ලියාපදිංචි නොකල වාහන ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iii) | 2006 අංක 12 දරන මුද්දර බදු (විශේෂ විධිවිධාන ) පනත | 65,675 | සභාව විසින් අයකර තිබුණු මුද්දර ගාස්තු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වරයාට ප්‍රේෂණය කර නොතිබුණි. | පනතට අනුව කටයුතු කළ යුතු වේ. | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ප්‍රේෂණය කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කරමි. |

1.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු
---------------------------------------------------------------

| ලැබිය යුතු ගිණුම් නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය අනුව විධිමත් අනුමැතියකින් තොරව සභාවට ලැබිය යුතුව තිබුණු හිඟ ආදායම් රු.9,341,094 ක් ලියා හැර තිබුණි. මෙම ලියාහැරීම් සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ද ඉදිරිපත් කර නොතිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය අනුව විධිමත් අනුමැතියක් යටතේ ලියාහැරීම සිදුකළ යුතු වේ. | හිඟ ආදායම් පිළිබඳ පරීක්ෂා කිරීමේදී පෙර වර්ෂවල සිට පැවතෙන මෙම අගයන් ගිණුම්කරණ අඩුපාඩු හේතුවෙන් පවතින බව හඳුනාගැනීම නිසා එම වැරදි නිවැරදි කිරීම සඳහා මහසභා අනුමැතියක් ලබා ගැනීමෙන් අනතුරුව මෙම ශේෂයන් නිවැරදි කිරීම සිදුකර ඇත. |

## 02. මූල්‍ය සමාලෝචනය
-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු 8,882,652 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,578,175 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය
----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස පුරනැඟුම ව්‍යාපෘතියේ මුදල් ගිණුමෙන් රු.2,400,000 ක් පොදු වියදම් ගිණුමට මාරුකර සභාවේ වියදම් දරා තිබුණි. | පුරනැගුම ව්‍යාපෘති මුදල් අදාළ කාර්යය සඳහා පමණක් දැරීමට කටයුතු කළ යුතුවේ. | මේ වනවිට රු.2,400,000 ක මුදල නැවත පුරනැගුම ගිණුමට තැන්පත් කර ඇත. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම් , රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 519,800 | 340,300 | 327,900 | 12,400 | 480,000 | 337,930 | 337,930 | 2,113,950 |
| (ii) | කුලී | 4,871,313 | 4,806,790 | 4,649,323 | 157,467 | 5,533,525 | 3,771,743 | 3,690,701 | 1,308,382 |
| (iii) | බලපත්‍ර ගාස්තු හා සේවා | 209,550 | 307,300 | 307,300 | - | 1,982,680 | 1,083,408 | 1,083,408 | - |
| (iv) | වෙනත් ආදායම | 50,202,112 | 41,379,499 | 36,153,590 | 5,225,909 | 8,000,000 | 10,286,746 | 5,444,997 | 20,277,231 |
| | | 55,802,775 | 46,833,889 | 41,438,113 | 5,395,776 | 15,996,205 | 15,479,827 | 10,557,036 | 23,699,563 |

### 2.3.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ දියුණු කල ප්‍රදේශවල දේපළ වලින් වරිපනම් බදු අයකර නොතිබුණි. | වරිපනම් බදු පනවා ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | දියුණු කළ ප්‍රදේශය ලෙස නම් කළ ප්‍රදේශය සිතියම් හා මායිම් උපලේඛනයද සහිතව පළාත් පාලන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. |

### 2.3.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පණ්ඩුලගම ආදර්ශ ගම්මානයේ පිහිටි කඩකාමර 10 කින් වර්ෂ 2-6 අතර කාලයක සිට පැවත එන රු.426,127 ක් වූ හිඟ හිටි කඩකුලී ශේෂ අයකර නොතිබුණි. | හිඟ කුලී අයකරගත යුතුවේ. | මෙලෙස අයකිරීම නොහැකි වී ඇත්තේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හිමිකරිත්වය පවසමින් ලිඛිත දැනුම්දීම් කිරීමයි. මේ පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් අනුව පණ්ඩුලගම පිහිටි කඩ භූමි මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට පවරා දෙන ලෙස අතිගරු ජනාධිපති තුමාගේ අවධානයට යොමු කර ඇත. |

2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.2,559,333 ක් හා මුද්දර ගාස්තු රු. 24,351,268 ක් විය. | මුද්දර ගාස්තු, උසාවි දඩ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ලැබිය යුතු උසාවි දඩ, මුද්දර ගාස්තු අය කර ගැනීමට කටයුතු සිදු කරමි. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව වු නිරීක්ෂණය වු කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු නමුත් 2019 දෙසැම්බර් 31 දින වනවිටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වේ. | අතුරු වියවස්ථා පැනවීමට කටයුතු සිදුකරමින් පවතින බව ප්‍රකාශ කරමි. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇති බව ප්‍රකාශ කරමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධව සභාව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒ අනුව වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුවේ. | 2030 දී ලඟාකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන සභාව මගින් ක්‍රියාත්මක කිරමට ඉදිරියේදී කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ස්ථාන මාරුවී ගිය හා විශ්‍රාම ගිය සේවකයින් 07 දෙනකුගෙන් අයවිය යුතුව තිබුණු සේවක ණය රු.172,682 ක් වසර 10 ක් ඉක්ම වූ කාලයක සිට අයකරගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිට විශ්‍රාම ගිය සහ ස්ථාන මාරු වී ගිය සේවකයින්ගෙන් අයවිය යුතු සේවක ණය අය කර ගැනීම සඳහා මේ වන විට කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) | 2015 වර්ෂයේ සිට රු.1,063,950 ක හිඟ කසළ බදු ආදායම් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම හිඟ මුදල අයකර ගැනීමට සාධාරණ හේතුන් නොමැති වීම නිසා මෙම හිඟය කපා හැරීමට කටයුතු කරන බව ප්‍රකශ කරමි. |
| (ඇ) | 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව සතිපොළ බදු ආදායම් රු.47,465 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු සපයා නැත. |
| (ඇ) | 2015 වර්ෂයට පෙර සිට පවතින රු.556,520 ක හිඟ මස්කඩ බදු ආදායම් සභාව විසින් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මස් කඩ බදු ආදායම අයකර ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. |

3.3 වත්කම් කළමනාකරණය

3.3.1 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | වටිනාකම රු.10,405,318 ක් වූ මෝටර් වාහන 13 ක් වසර 02 ක සිට වසර 05 දක්වා කාලපරිච්ඡේදයක සිට නිශ්කාර්යව පැවතුණි. | අළුත්වැඩියා කිරීමට හෝ වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙහි පාවිච්චි කළ නොහැකි තත්ත්වයේ පවතින වාහන 2020 භාණ්ඩ සමීක්ෂණයේ දී සුදුසු ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | වටිනාකම රු.26,810,000 ක් වූ ඉඩම් ගොඩනැගිලි ඉදිකිරීම් සහ උපකරණ නිශ්ක්‍රීයව පැවතුණි. | සභාව සතු වත්කම් ඵලදායී කාර්යයන් සඳහා යොදා ගත යුතු වේ. | පිළිගනිමි. |